- ජාතික අභිමානය, ජාතික උරුම රැක ගැනීමට සහ ආරක්ෂා කිරීමට දායක වීම
- දරුවන්ට, වැඩිහිටියන්ට, ආබාධිතයින්ට, රෝගීන්ට රැකවරණය, පෝෂණය සහ ආදරය ලබා දීම
- රජයේ සුබසාධන සේවා අයථා ලෙස පරිහරණයෙන් වැලකීම හා ඒවා ආරක්ෂා කිරීමට දායක වීම

**සමාජ සංවර්ධනයට සහ යහපාලනයට සහය වීම**

- ගැටුම් ඇති කර ගැනීමෙන් වැලකීම හා ගැටුම් වැළැක්වීමට දායක වීම
- විවිධ ජන කොටස්වල අනන්‍යතාව ආරක්ෂා කිරීම හා ඒවාට ගරු කිරීම
- අන්‍ය මත ඉවසීම සහ සාධාරණ ව කටයුතු කිරීම
- සාකච්ඡා මාර්ගයෙන් ගැටලු විසඳා ගැනීම හා ප්‍රචණ්ඩකාරී ක්‍රියා සඳහා යොමු වීමෙන් ඇති වන අවාසිදායක තත්ත්වයන් පිළිබඳ අවබෝධය
- ප්‍රාදේශීය සංවර්ධනයට ක්‍රියාකාරී ව සහාය වීම හා මඟ පෙන්වීම
- විවිධ ආපද සහ සහන සේවාවන් ලබා ගැනීමේ දී අවංක ව හා නිවැරැදි ව කටයුතු කිරීම

**පරිසර කළමනාකරණයට දායක වීම**

- ස්වාභාවික පරිසරය ආරක්ෂා කර ගැනීම, රැක ගැනීම සහ එහි වැදගත්කම පිළිබඳ අවබෝධය
- ස්වාභාවික පරිසරය විනාශ කිරීමට හවුල් නොවීම සහ විනාශ කරන්නන් ඉන් වැළැක්වීමට කටයුතු කිරීම
- කසල බැහැර කිරීම වගකීමෙන් ක්‍රමවත් ව සිදු කිරීම
- විවිධ අහිතකර ද්‍රව්‍ය පරිසරයට මුදා හැරීමෙන් වැලකීම
- යහපත් පුරවැසියකු ලෙස හැමවිට ම කටයුතු කිරීම

ශ්‍රී ලාංකික පුරවැසියන් ලෙස අප මව්බිමට ආදරය කළ යුතු අතර අභිමානවත් ජාතියක් වශයෙන් නැගී සිටීමට ජාතික සමගිය තහවුරු කරගත යුතු ය. සැම විට ම සාධාරණ ව හා යුක්ති සහගත ව කටයුතු කිරීමට වගබලා ගත යුතු ය. රටෙන් අපට ඉටු විය යුතු යුතුකම් පිළිබඳ සැලකිලිමත් වනවා මෙන් ම අපෙන් රටට ඉටු විය යුතු යුතුකම් ද නොපිරිහෙලා ඉටු කළ යුතු ය. ආණ්ඩුවේ විවිධ ස්තරවල කාර්යභාරය මහජන කටයුතු පහසු කරවීමයි. මෙම විවිධ ආයතනවල කටයුතු කරන්නේ ද මහජනයා වෙනුවෙන් මහජනයාම ය. ඒ නිසා පුරවැසි යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීම, අල්ලස, දූෂණය,

නාස්තිය වලක්වමින් කටයුතු කිරීම අප සතු යුතුකම හා වගකීමයි. ඔබ ද වගකීමෙන් කටයුතු කරන ආදර්ශමත් පුරවැසියකු වීම ජාතියේ බලාපොරොත්තුවයි.

## ක්‍රියාකාරකම්

- පුරවැසියා කෙරෙහි ආණ්ඩුවේ විවිධ ස්තරවල වගකීම් හා පුරවැසියාගෙන් ඉටුවිය යුතු යුතුකම් ලැයිස්තුවක් සෑම ශිෂ්‍ය-ශිෂ්‍යාවක් විසින් වෙන වෙනම සකස් කරන්න.
- පන්තියේ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් කණ්ඩායම් කිහිපයකට බෙදී තම තමන් සකස් කර ගත් ලැයිස්තුවල සඳහන් කරුණු පිළිබඳ සාකච්ඡා කර ඉතා වැදගත් කරුණු පිළිවෙලින් පෙළ ගස්වා ගන්න.
- එක් එක් කණ්ඩායම් තම කණ්ඩායම් ක්‍රියාකාරකම පන්තියට ඉදිරිපත් කරන්න.
- ගුරුවරයාගේ සහාය ඇතිව කණ්ඩායම් ඉදිරිපත් කළ ඉතා ම වැදගත්ම කරුණු පෝස්ටරයක් ලෙස සකස් කර පන්තියේ ප්‍රදර්ශනය කරන්න.